# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,928 - 2015 අගෝස්තු මස 14 වැනි සිකුරාදා - 2015.08.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1134 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 සැප්තැම්බර් මස 04 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 අගෝස්තු මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1133 - B 80975— 5,352 (2015/08)
F 1 –

# පළාත් පාලන නිවේදන

## නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම


1989 අංක 12 දරන (අනුෂාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv(ආ) කොටසෙහි ප්‍රකාශයට පත් කරන ලද පහත සඳහන් උපලේඛනයේ සඳහන් මාර්ගය නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ජී. පී. සෙනවිරත්න,<br>
ලේකම්,<br>
නැ. නු. ප. ප්‍රාදේශීය සභාව,<br>
විජයපුර.

මාර්ගයේ නම :- ගැමුණු මාවත<br>
වසම :- 242 වන්නියන්කුලම<br>
දිග :- මීටර් 956<br>
පළල :- මීටර් 6.00<br>
මාර්ගය හරහා වැටී ඇති ඉඩම්වල විස්තර :

| *අනු. අංකය* | *පාරේ වම්පස* |
|---|---|
| 1. | ජී. ඩබ්. සෝමපාල |
| 2. | ඒ. ඩබ්. සෝමවතී |
| 3. | ඉන්දික ප්‍රියදර්ශන |
| 4. | ඩී. එස්. දිසානායක |
| 5. | ජී. වී. ඒ. සෝමදාස |
| 6. | එස්. ප්‍රේමතිලක |
| 7. | එච. එම්. ලිලිනෝනා |
| 8. | එල්. ඒ. ඩී. රුවිර දේවිකා |
| 9. | ජේ. ඩී. සමන් |
| 10. | යූ. එම්. සුනිල් පෙරේරා |
| 11. | එස්. ඒ. කුසුමලතා |
| 12. | ඒ. සීලවති |
| 13. | එම්. කේ. ජී. ලක්ෂ්මන් |
| 14. | ටී. කේ. සිරිපාල |
| 15. | ටී. කේ. රොෂාන් සුජීව |
| 16. | ටී. ප්‍රේමදාස |
| 17. | කේ. ටී. මධුසංක |
| 18. | කේ. ටී. ප්‍රේමසිරි |
| 19. | ආර්. ප්‍රියානි සමන්ලතා |
| 20. | ජේ. එම්. චන්ද්‍රලතා |

| *අනු. අංකය* | *පාරේ දකුණු පස* |
|---|---|
| 1. | බී. කුමාරසිංහ |
| 2. | එක්සත් ග්‍රාම සංවර්ධන සමිතිය |
| 3. | වී. ඒ. රන්දුනු |
| 4. | වී. ඒ. ධර්මදාස |
| 5. | ඩබ්. සුමනදාස |
| 6. | ඒ. එල්. සිසිර සමන් |
| 7. | ආර්. එම්. අනුරසිරි කුමාර |
| 8. | ආර්. එම්. එමලින් නෝනා |
| 9. | ආර්. එම්. චන්ද්‍රවති |
| 10. | සුජිත් මංජුල කුමාර |
| 11. | සී. වයි. අබේවර්ධන |
| 12. | නිරෝෂාන් මංජුල |
| 13. | එච්. ජී. එස්. හේමසිරි |
| 14. | එච්. ඒ. ඇඩ්වින් |
| 15. | එස්. එම්. ගාමිණී ධනපාල |
| 16. | බංදුල අබේවීර |
| 17. | දේවා කුමාර |
| 18. | පී. ජී. ඩබ්. මිණිකේ |
| 19. | වයි. එල්. හේරත් |
| 20. | සමන්ති දීපිකා මුණසිංහ |
| 21. | පුෂ්පජීව හෙට්ටිගොඩ |
| 22. | එස්. ඩබ්. මල්කාන්ති |
| 23. | එච්. පී. සරත් කුමාර |
| 24. | උදේණි ධබදෙනිය |
| 25. | ටී. සිරිතුංග ද සිල්වා |
| 28. | කේ. සිරියලතා |
| 29. | එන්. ටී. දිසානායක |
| 30. | එම. ප්‍රියන්ති ජයලත් |



08-430

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදළ ඉඩම්වල හිමිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පල වූ දිනයේ සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(11) වැනි වගන්ති ප්‍රකාරව ක්‍රියා කරන ලෙස මින් දනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරෝධතාවයක් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

අයි. එම්. එස්. කේ. මහින්ද ඉදිසූරිය,
ලේකම්/ බලයලත් නිලධාරි,
උඩුනුවර ප්‍රාදේශීය සභාව.
ගෙලිඔය.

| අනු. අංකය | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම් පස පදිංචිකරුවන් | දකුණු පස පදිංචිකරුවන් | දිග (අඩි) | පළල (අඩි) |
|---|---|---|---|---|---|---|---|
| 01 | දෙල්අද්ද කුඹුර පාලම අසලින් ගණිත ගෙදර හරහා ගඟුල්දෙණියට යන මාර්ගය | දෙල්අද්ද කුඹුර අසලින් | ගඟුල්දෙණිය | යූ. එන්. රාජපක්ෂ<br>ජී. ජී, තිලක් සමන් කුමාර<br>ජී. ජී. ගුණතුංග<br>ජී. ජී. නිසංසලා සුභාෂිණී<br>ජී. ජී. චන්දන කුමාර සෙනගේ<br>ගණිත ගෙදර නන්දසේන<br>ගාමිණී සෝමවීර | පී. ජී. එල්. එස්. එස්. බී. තිලකරත්න<br>ගණිතගෙදර විජේරත්න<br>ජී. ජී. ආර්. එම්. ඩබ්. කුමාරනායක<br>ගණිතගෙදර අබේරත්න<br>කේ. එන්. එන්. කරුණාසිංහ<br>ජී. ජී. සුමනදස | මීටර් 800 | අඩි 8 |
| 02 | මැද්දේගොඩ පාර | බූවැලිකඩ ගෙලිඔය ප්‍රධාන මාර්ගය | දියමාරුවකුඹුරුව කුඹුර | ඩබ්. එම්. එල්. බී. වික්‍රමසිංහ<br>එච්. එම්. විජිත බංඩා හේරත්<br>එච්. එම්. කුසුමාවතී මැණිකේ<br>එච් එම්. චන්ද්‍රාවතී මැණිකේ<br>එච්. එම්. ඒ. බී. හේරත්<br>පී. එම්. රාජපක්ෂ | ඩබ්. එම්. එල්. බී. වික්‍රමසිංහ<br>එච්. එම්. තිලකරත්න බංඩා<br>එච්. එම්. පී. සංජීවිකා හේරත් | අඩි 620 | අඩි 10 |
| 03 | කපුවත්තේගෙදර පාර | අංක 104, ගංගොඩ, පිළිමතලාව | යූ. බී. රන්දෙණිය අංක 30/2, ගංගොඩ, පිළිමතලාව | එස්. එම්. එස්. අබේරත්න<br>එල්. එච්. ඩී. සී. චමින්ද්‍රිකා ද සිල්වා<br>එච්. එම්. මුතුබංඩා<br>එච්. එම්. ඩී. ඇන්තනී<br>එම්. එම්. සේනාරත්න<br>එස්.එම්.එස්.කේ.අබේරත්න<br>ආර්. එම්. යසෝ මැණිකේ<br>යූ. බී. රන්දෙණිය | එල්. වී. අළුවිහාරේ<br>ඩී. ඒ. එන්. දන්ලවා<br>එස්. ආර්. ඩබ්. එච්. ටී. පී. කුමාරිහාමි<br>චන්දන අබේරත්න<br>එස්. එම්. ජී. එන්. අබේරත්න | මීටර් 230 | අඩි 10 |

| අනු. අංකය | මාර්ගයේ නම | ආරම්භය | අවසානය | වම් පස පදිංචිකරුවන් | දකුණු පස පදිංචිකරුවන් | දිග (අඩි) | පළල (අඩි) |
|---|---|---|---|---|---|---|---|
| 04 | දිද්දෙණිය කුඹුර පාර | - | - | ජේ. ඇම්. රාසික් ෂර්ඩ්<br>නන්දනී සුගත්<br>එම්. ඒ. අමීන්<br>ඒ. ජී. සුමනාවතී<br>ජේ. ඒ. එස්. එම්. බීබි<br>එම්. එෆ්. එම්. නසීමා | ගොඩමුන්නේ පඤ්ඤකිත්ති හිමි<br>බී. එම්. කාසීම්<br>ඒ. ඩබ්. එම්. රාෂිඩ්<br>ඒ. එල්. ඇම්. පජුර්දීන්<br>මොහොමඩ් රිස්වි | අඩි 680 | අඩි 06 |
| 05 | යට්ටකුල උගුරැස්ස ගහගොඩ පාර | තෙලඹුගල නිග්‍රෝධබෙත්ත පිරිවෙන ළඟ සිට | උගුරැස්ස ගහගොඩ ළිඳ දක්වා | විහාරාධිපති ගොඩමුන්නේ පඤ්ඤකිත්ති හිමි | - | අඩි 1,000 | අඩි 08 |
| 06 | මල්පැලගොඩ දියබේරිය හේන පාර | දියබේරිය පාර සිට | අංක 035 ඉඩම අසලින් | මහේෂ් අනුරාධ | මල්කාන්ති ශිරෝමාලා<br>කේ. ජී. පියදස<br>ඩබ්. ජී. ශ්‍රියානී ධම්මිකා<br>කේ. ජී. පාලිත සේනාරත්න | මීටර් 300 | අඩි 07 |

08 - 358

---

## අකුරැස්ස ප්‍රාදේශීය සභාව

261 වැනි අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර අකුරැස්ස ප්‍රාදේශීය සභාව විසින් 2015.01.23 දින පවත්වන ලද සභා රැස්වීමේදී පහත උපලේඛනයේ සඳහන් අංක 06.01.(xx) දරන යෝජනාව සම්මත කරන ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉදුනිල් ජයවීර,
සභාපති,
අකුරැස්ස ප්‍රාදේශීය සභාව.

2015 මාර්තු මස 05 වැනි දින,
අකුරැස්ස ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධි විධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු, 261 වැනි අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013.05.17 දින අංක 1811 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද, දකුණු පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලද බව 2014.08.29 දින අංක 1878 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථා වල (i,ii,iii,xvii,xviii,xxi,xxii,xxiii,xxv හා xxvii) දක්වා වූ කාණ්ඩ මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට පිළිගෙන ක්‍රියාත්මක කිරීමට, ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ අකුරැස්ස ප්‍රාදේශීය සභාව මෙයින් යෝජනා කරන්නීය.

08-293

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

F 2 - B 080975